
# SLLA පුවත් හසුන

වෙළුම 37 | කලාපය 04 | අප්‍රේල් - ජුනි 2021 | ISSN 1391 -2531

## රජයේ පුස්තකාලයාධිපතිවරු බඳවා ගැනීමේ විවෘත/සීමිත තරඟ විභාගය 2021 මාර්ගගත (Online) සම්මන්ත්‍රණ

ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ රජයේ පුස්තකාල කණ්ඩායම සංවිධානය කල සම්මන්ත්‍රණ මාලාව 2021 මාර්තු 27 දින ආරම්භ විය. මෙම සම්මන්ත්‍රණ මාලාව සංවිධානය කරනු ලැබුවේ මෙවර රජයේ පුස්තකාලයාධිපතිවරු බඳවා ගැනීමේ විවෘත/සීමිත තරඟ විභාගය සඳහා පෙනී සිටීමට නියමිත අයදුම්කරුවන් වෙනුවෙනි. ඉතා සාර්ථකව පැවැත්වුනු මෙම සම්මන්ත්‍රණ මාලාව අයදුම්කරුවන්ගේ ඉල්ලීම පරිදි මාර්ගගත ක්‍රමයට පුරා දින 8ක් පවත්වන ලදී. මෙහි දේශන සඳහා ආචාර්ය රුවන් ගමගේ මහතා, ආචාර්ය ආර්. ඩී. ආනන්ද තිස්ස මහතා, ආචාර්ය කේ. ආර්.එන්. හර්ශනී මිය සහ කේ.එන්. සමන්ති මෙනවිය සම්පත්දායකයින් ලෙස සම්බන්ධ වූහ. මෙම සම්මන්ත්‍රණ මාලාවට සම්බන්ධ වූ සියලුම සිසුන් වෙනුවෙන් “Government Librarian Exam” නමින් සකස් කල WhatsApp Group එක හරහා සියලුම දේශනවල වීඩියෝපට සහ ඊට අදාල පාඩම් මාලා ලබාගත හැකිය. එසේම මෙම සම්මන්ත්‍රණ මාලාවට සමගාමීව “Government Libraries Group in Sri Lanka” යනුවෙන් බ්ලොග් අඩවියක් රජයේ පුස්තකාල කණ්ඩායමේ කැඳවුම්කරු ඒම්. කේ. ජී. යානිකා නන්දසේන මිය විසින් සකස් කරන ලදී. විෂය පිළිබඳ කාලීන දැනුම ලබා ගැනීමට මෙම බ්ලොග් අඩවිය භාවිත කල හැකිය.




https://governmentlibraysrilanka.blogspot.com/

## බුද්ධිමය දේපල හා ප්‍රකාශන හිමිකම පිළිබඳ මාර්ගගත සම්මන්ත්‍රණය








ශ්‍රී ලංකාවේ තොරතුරු හා මහජන සම්බන්ධතා (IPR) කමිටුවේ උපදේශක සහ වෘත්තීය ආචාර ධර්ම පිළිබඳ උප කමිටුව 2021 මැයි 19 වෙනි දින " ඩිජිටල් යුගයේ ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපල හා ප්‍රකාශන හිමිකම් නීතිය: පුස්තකාල වෘත්තිකයන්ගේ ඉදිරිදර්ශනය" මැයෙන් මාර්ගගත දේශනයක් පවත්වන ලදී. සම්පත්දායකයින් ලෙස විනෝදාත්මක, බුද්ධිමය දේපල, තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ, මාධ්‍ය, ක්‍රීඩා සහ වාණිජ නීතිය පිළිබඳ නීති උපදේශක නීතිඥ චානක්‍ය ජයදේව මහතා සහ ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපල සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල් ගීතාංජලී රණවක මහත්මිය සහභාගි වූහ. මෙම සම්මණ්ත්‍රණය සඳහා ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ හා පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයේ විද්වතුන් හා සිසුන් ඇතුළුව 41 දෙනෙක් සහභාගී වූහ.

## ඇතුල් පිටු

රජයේ පුස්තකාලයාධිපතිවරු බඳවා ගැනීමේ විවෘත/සීමිත තරඟ විභාගය 2021 මාර්ගගත (Online) සම්මන්ත්‍රණ 01
බුද්ධිමය දේපල හා ප්‍රකාශන හිමිකම පිළිබඳ මාර්ගගත සම්මන්ත්‍රණය 01
SLLA සම්පත් ද්වාරය (SLLA Gateway) 02
පුස්තකාල කාර්යාල කටයුතු සඳහා ගූගල් වැඩබිම භාවිතා කිරීම පිළිබඳ මාර්ගගත පුහුණුව 02
SLLA අධ්‍යාපන කමිටුව - මාර්ගගත සම්මන්ත්‍රණ 02
ලෝක පොත් සහ ප්‍රකාශන හිමිකම් දිනය - චුන්නාකම් මහජන පුස්තකාලයේ සැමරුම 03
එළදායී සන්නිවේදකයෙකු වීම පිළිබඳ පුහුණු සැසිය 03
හෝමාගම ප්‍රාදේශීය සභා පුස්තකාල පද්ධතිය සංවර්ධනය කිරීමේ නව වැඩපිළිවෙලක් 03
විශේෂාංග ලිපිය - ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකත්ව නිර්ණායක පිළිබඳව නැවත සළකාබැලීමක් 04
පුස්තකාල පුහුණු වැඩසටහන - කිලිනොච්චිය 05
ප්‍රතිරාව" නැමති විශේෂ විද්‍යුත් සමරු කලාපය 05
ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ප්‍රකාශන කමිටුව -2020/21 05

*Sri Lanka Library Association, Organization of Professional Associations, 275/75, Stanly Wijesundara Mawatha, Colombo 07, Sri Lanka, Tel/Fax: +94-11-2589103, Email:info@slla.lk.*

# SLLA සම්පත් ද්වාරය (SLLA Gateway)

එක් අතුරු මුහුණතක් තුළින් සියලුම සාධිකාරී වෙබ් සම්පත් වෙත පහසුවෙන් ප්‍රවේශය ලබා දීමේ අරමුණින්, ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ අධ්‍යයන පුස්තකාල කණ්ඩායම (2020/2021) "SLLA Gateway" නමින් සම්පත් ද්වාරයක් දියත් කරන ලදී . පවතින කෝවිඩ් වසංගතය හෙතුවෙන් සහ පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථාන වෙත භෞතික ප්‍රවේශය සීමා වීම හේතුවෙන් වර්තමානයේ බොහෝ ක්‍රියාකාරකම් සිදුකරනු ලබන්නේ අන්තර්ජාලය භාවිතා කිරීම මඟින්ය.කෙසේ නමුත් අන්තර්ජාලය හරහා විශ්වාසදායක තොරතුරුවලට ප්‍රවේශවීම සෑම කෙනෙකුම මුහුණ දෙන අභියෝගයකි. එම නිසා, තොරතුරු ගවේශනය කරන සහ විශේෂයෙන් පුස්තකාලයාධිපතිවරුන්ට තොරතුරු ලබා ගැනීම සඳහා "SLLA Gateway" මගින් සාධිකාරී වෙබ් සම්පත් වෙත පහසුවෙන් ප්‍රවේශවීමට අවශ්‍යය සබැඳීන් (web links) සපයාදීම ඉතාමත් ප්‍රයෝජනවත් වේ. ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ අධ්‍යයන පුස්තකාල කණ්ඩායම විසින් මෙම සම්පත් ද්වාරය COMAISP යටතේ ව්‍යාපෘතියක් ලෙස වැඩි දියුණු කරන ලදී. www.gateway.slla.lk හරහා මෙම සම්පත් ද්වාරයට පිවිසිය හැකිය.




## පුස්තකාල කාර්යාල කටයුතු සඳහා ගූගල් වැඩබිම භාවිතා කිරීම පිළිබඳ මාර්ගගත පුහුණුව

ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ අධ්‍යයන පුස්තකාල කණ්ඩායම විසින් (2020/21) විශ්ව විද්‍යාල, මහජන හා අනෙකුත් පුස්තකාලවල, පුස්තකාල කාර්ය මණ්ඩල සඳහා "පුස්තකාල කාර්යාල කටයුතු සඳහා ගූගල් වැඩබිම" පිළිබඳ මාර්ගගත පුහුණුවක් 2021 මැයි 06 දින සංවිධානය කරන ලදී. කොවිඩ් 19 වසංගතය සමඟ පවතින වාතාවරණය හේතුවෙන්, ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ අධ්‍යයන පුස්තකාල කණ්ඩායම මාර්ගගතව, පුස්තකාලයාධිපතිවරුන් සඳහා ගූගල් සම්පත් මගින් මාර්ගගතව රාජකාරි ඉටු කිරීමේ අවශ්‍යතාවය සහ මාර්ගගතව වැඩ කිරීමේ සංස්කෘතියේ වැදගත්කම අවබෝධ කර ගනිමින් මෙම පුහුණු වැඩසටහන සිංහල හා දෙමළ මාධ්‍යයෙන් වෙන වෙනම මාර්ගගතව නොමිලේ පැවැත්විණි. එම්. එන්. රවිකුමාර් මහතා (ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති, නැගෙනහිර විශ්වවිද්‍යාලය) දෙමළ මාධ්‍ය සම්පත්දායකය ලෙස සේවය කළ අතර ඩී.පී.සී.විතාන මහත්මිය (ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය) සිංහල මාධ්‍ය සඳහා සම්පත්දායකය ලෙස කටයුතු කළේය. මෙම පුහුණුව සඳහා සිංහල මාධ්‍යයෙන් 134 දෙනෙකු සහ දෙමළ මාධ්‍යයෙන් 95 ක් සහභාගී වූහ.

## SLLA අධ්‍යාපන කමිටුව - මාර්ගගත සම්මන්ත්‍රණ

### ග්‍රන්ථ නාමාවලියන් අධීක්ෂණය කරන්නේ කෙසේද

SLLA අධ්‍යාපන කමිටුව මඟින් 'ග්‍රන්ථ නාමාවලියන් අධීක්ෂණය කරන්නේ කෙසේද' යන්න පිළිබඳව HDIPLIS I ග්‍රන්ථ නාමාවලි / අනුක්‍රමණිකා පිළිබඳ අධීක්ෂකයින් සහ පරීක්ෂකවරුන් සඳහා 2021 මැයි 08 වන දින සූහුරු (Zoom) තාක්ෂණය ඔස්සේ මාර්ගගත සම්මන්ත්‍රණයක් සංවිධානය කරන ලදී. මෙම සම්මන්ත්‍රණයේ අරමුණ වූයේ ග්‍රන්ථ නාමාවලියක් අධීක්ෂණය කිරීමේ දී වන වැරදි අවම කිරීමයි. ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සම්පූර්ණ දේශක මණ්ඩලය සඳහා සම්මන්ත්‍රණය විවෘතවිය. කේ.කේ.ජී. විජේවීර මහතා සහ අමරා නානායක්කාර මහත්මිය මෙම සම්මන්ත්‍රණයේ සම්පත්දායකයින් ලෙස කටයුතු කළ අතර සම්මන්ත්‍රණය සඳහා 23 දෙනෙක් සහභාගී වූහ.

### DLIS සහ HDIPLIS I සඳහා සුවිකරණය

SLLA අධ්‍යාපන කමිටුව මඟින් සංවිධානය කළ දෙවන මාර්ගගත සම්මන්ත්‍රණය SLLA ආචාර්යවරුන් සහ සුවි සකස්කරන්නන් සඳහා පවත්වන ලදි. එමඟින් 'DLIS සහ HDIPLIS පාඨමාලා සඳහා සුවිකරණය : සුවිකරණය පාඩම් ඉගැන්වීමේදී ඒකාකාරී බව (uniformity) පවත්වා ගන්නේ කෙසේද' යන්න පිළිබඳව සාකච්ඡා කරන ලදි. මෙම මාර්ගගත සම්මන්ත්‍රණයේ ප්‍රධාන අරමුණ වූයේ ශිෂ්‍යයින් විසින් සුවිකරණ ප්‍රවේශ සැකසීමේ දී සිදුකරන අත්වැරදීම් පැහැදිලි කිරීමයි. මෙම සම්මන්ත්‍රණය 2021 මැයි මස 25වන දින මාර්ගගතව මෙහෙයවනු ලැබුවේ කේ. කමලම්බිකායි මහත්මිය විසිනි. මෙම වැඩමුළුව සඳහා ආචාර්යවරුන් 09 දෙනෙකු පමණ මාර්ගගතව සහභාගී වූහ.

### DLIS සහ HDIPLIS I සඳහා වර්ගීකරණය

SLLA අධ්‍යාපන කමිටුව විසින් සංවිධානය කළ තෙවන මාර්ගගත සම්මන්ත්‍රණය 2021 ජුනි මස 16 වන දින 'DLIS සහ HDIPLIS I පාඨමාලා සඳහා වර්ගීකරණය: වර්ගීකරණ පාඩම් වල සහායක වගු ඉගැන්වීමේදී ඒකාකාරී බව (uniformity) පවත්වා ගන්නේ කෙසේද' යන්න පිළිබඳව ගුරුවරුන් හා වෘත්තිකයින් දැනුවත් කිරීම සඳහා පවත්වන ලදි. මෙම සම්මන්ත්‍රණයේ මූලික අරමුණු ලෙස, DLIS සහ HDIPLIS I සිසුන් සඳහා සහායක වගු භාවිතා කිරීමට තීරණයකිරීම, පැවරුම් ලබා දෙන ආකාරය පිළිබඳ සාකච්ඡා කිරීම, විභාග ප්‍රශ්න පත්‍ර සකස් කිරීම සඳහා නවීකාරකවරයෙකු (moderator)පත් කිරීම පෙන්වාදිය හැකිය. ආචාර්ය ආර්. ඩී. ආනන්ද තිස්ස සහ ආචාර්ය කල්පනා චන්ද්‍රසේකර මෙම සාකච්ඡාවට මූලිකත්වය ලබා දුන්හ. මෙම සම්මන්ත්‍රණයට දේශකවරුන් 15 දෙනෙකු පමණ සහභාගී වී සිටි අතර පාඨමාලාවේ ඇති අඩුපාඩු මඟහරවා ගැනීම සඳහා ඵලදායී යෝජනා ඉදිරිපත් කළහ.

## ලෝක පොත් සහ ප්‍රකාශන හිමිකම් දිනය - චුන්නාකම් මහජන පුස්තකාලයේ සැමරුම

චුන්නාකම් මහජන පුස්තකාලය 2021 අප්‍රේල් 23 දින ලෝක පොත් හා ප්‍රකාශන හිමිකම් දිනය සමරනු ලැබීය.පුස්තකාලයාධිපති සහ විදේශයන්හි පොත් සම්බන්ධීකාරක එන්.සෙල්වරාජා මහතා විසින් පරිත්‍යාග කරන ලද පොත් මෙම දිනයේ ප්‍රදර්ශනය කෙරිණි. ආරක්ෂිත පියවරයන් අනුගමනය කරමින් ගෞරවනීය ලේකම්, පාඨකයින් සහ සුභ පතන්නන් මේ සඳහා සහභාගී වූහ.











## ඵලදායී සන්නිවේදකයෙකු වීම පිළිබඳ පුහුණු සැසිය

පණිවිඩයක් සන්නිවේදනය කිරීමට හෝ අදහස් ප්‍රකාශ කිරීම සඳහා කථා කිරීම පුද්ගලයෙකුගේ ජීවිතයේ දෛනික ක්‍රියාකාරකමකි. අප සියලු දෙනාම අන් අය අභිප්‍රේරණය කිරීමට, බලපෑම් කිරීමට, සාකච්ඡා කිරීමට හෝ ඒත්තු ගැන්වීමට කථා කරන අවස්ථා තිබේ.නමුත් යමෙකුට ඵලදායි ලෙස සන්නිවේදනය කිරීමට අවශ්‍ය නම් ඒ සඳහා ඵලදායි සන්නිවේදන ක්‍රියාවලියක් තිබිය යුතුය.

සාර්ථක සන්නිවේදකයෙක් සාර්ථක නායකයෙකි යන අරමුණ ඇතිව 2021 ජුනි මස 3 වන දින ශ්‍රී ලංකා පුස්තකාල සංගමය විසින් මාර්ගගත පුහුණු සැසියක් සංවිධානය කරන ලදී. ලංකා බැංකුවේ විශ්‍රාමික පුස්තකාලයාධිපතිනි ශිවන්ති වීරසිංහ මහත්මිය මෙම පුහුණු සැසිය සඳහා සම්පත්දායක ලෙස කටයුතු කළ අතර මේ සඳහා ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පාලක මණ්ඩලයේ සාමාජිකයින් සහ එක්ස්කෝ සාමාජිකයින් සහභාගී වූහ.



## හෝමාගම ප්‍රාදේශීය සභා පුස්තකාල පද්ධතිය සංවර්ධනය කිරීමේ නව වැඩපිළිවෙලක්

හෝමාගම ප්‍රාදේශීය සභාවේ මහජන පුස්තකාල පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා 2021 වර්ෂයේදී පියවර ගෙන ඇත.

විශේෂයෙන්ම මේ යටතේ නවීන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදා ගෙන තොරතුරු ජනතාව වෙත සම්ප්‍රේෂණය කිරීම සඳහා කොහා මෘදුකාංගය පුස්තකාල සඳහා ස්ථාපිත කිරීමට මිලියන 4 කට ආසන්න මුදලක්ද ,පරිඝණක යන්ත්‍රෝ බඩු හා උපකරණ මිලදී ගැනීමට මිලියන 2.5ක මුදලක් පොත් පත් වලට අමතරව 2021 වර්ෂයේ වාර්ෂික ප්‍රතිපාදන වලින් ලබා දී ඇත. පුස්තකාල අලුත්වැඩියා කර යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමටද කටයුතු කරමින් පවතී.

විශේෂයෙන්ම රටේ පවතින කොරෝනා වසංගත රෝග තත්වය හමුවේ බල ප්‍රදේශයේ ජනතාව වෙත අවශ්‍ය අධ්‍යාපනික සහ විනෝදාත්මක තොරතුරු ලබා දීම සඳහා බණ්ඩාරනායක මහජන පුස්තකාලයේ මාර්ගගත ඉගෙනුම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමටත්,ප්‍රජා මණ්ඩල ආශ්‍රිතව Wi-Fi කලාප පිහිටුවීමටත් අදහස් කර ඇත.

මෙම සංවර්ධන කටයුතු හෝමාගම ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති සම්පත් චමින්ද ජයසිංහ මහතාගේ මගපෙන්වීම මත ප්‍රාදේශීය සභාවේ ලේකම් කුමුදුනී ගුණතිලක මහත්මියගේ උපදෙස් පරිදි ක්‍රියාත්මක කරන ලදී.

හෝමාගම බල ප්‍රදේශයේ ජීවත්වන ජනතාවගේ අධ්‍යාපනික, සමාජ හා සංස්කෘතික අගයන් සංවර්ධනය කිරීම මෙහි අරමුණ වේ.

# විශේෂාංග ලිපිය - ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකත්ව නිර්ණායක පිළිබඳව නැවත සළකාබැලීම



Dr. (Ms).C.N. K.අලහකෝන්
අධ්‍යාපන නිලධාරී, SLLA
ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

මෙරට පුස්තකාලයාධිපතිවරුන් සහ තොරතුරු වෘත්තිකයන් සඳහා සිය වෘත්තීය සුදුසුකම් ලබා ගැනීම උදෙසා වූ එකම ආයතනය වන්නේ ශ්‍රී ලංකා පුස්තකාල සංගමයයි. මෙමගින් පුහුණුව, සහයෝගීතාව, හා උපදෙස් ලබා දීම සඳහා මෙම සංගමය ඇප කැප වී සිටී. මෙම සංගමයේ සාමාජිකයින් වීමෙන් ඔහුට/ඇයට වෘත්තිකයෙකු ලෙස ඉහළට යාමට උපරිම හැකියාවක් ඇති අතර, එහි අධි සාමාජිකත්වය ලබා ගැනීම එම සාමාජිකයා ලබන ඉහළම වෘත්තීමය සුදුසුකම වන්නේය.

මෙම විශේෂාංග ලිපියෙහි සඳහන් වන්නේ යමෙකු ඔහුගේ/ඇයගේ වෘත්තීමය විශිෂ්ටත්වය සාක්ෂාත් කර ගැනීමේ දී අවධානය යොමු කළ යුතු වැදගත් කරුණු කිහිපයකි. පුස්තකාල හා තොරතුරු විද්‍යා ක්ෂේත්‍රයෙහි උසස් ඩිප්ලෝමාවක් හෝ වෙනත් උසස් සුදුසුකම් ලබා ඇති ඕනෑම සාමාජිකයෙකුහට ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකත්වය ලබා ගැනීමට අවස්ථාව ඇත.

සංගමයේ වෘත්තීය සාමාජිකයෙකු වීමේ ක්‍රියාවලියෙහි පියවර දෙකක් ඇත. එනම් ආශ්‍රේය සාමාජිකත්වය හා ආශ්‍රේය නොවන සාමාජිකත්වයයි. මෙම ආශ්‍රේය නොවන සාමාජිකත්වය යනු පුස්තකාල තොරතුරු විද්‍යා ක්ෂේත්‍රය තුළ ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් (උසස් ඩිප්ලෝමාවක් හෝ වෙනත් උසස් සුදුසුකම්) සළකා බැලීමෙන් අනතුරුව සාමාජිකත්වය ලබා ගන්නා නව සාමාජිකයන් වන අතර වාර්ෂික මහා සභා රැස්වීමෙහි දී මොවුනට සාමාජිකත්වය පිළිබඳ අදහස් විමසන අවස්ථාවල දී ඡන්දය භාවිතා කිරීමට බලයක් හිමි නොවේ.

පුස්තකාල හා තොරතුරු විද්‍යා ක්ෂේත්‍රයෙහි වසර 05ක පූර්ණ කාලීන සක්‍රී සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සාමාජිකයෙකු, පුහුණු පුස්තකාලයාධිපතිවරයෙකු (හෙවත් ආශ්‍රේය සාමාජිකයකු) යටතේ වසර දෙකකවත් පුහුණුව හා අධීක්ෂණය ලබා ගැනීමකින් අනතුරුව, එම සාමාජිකයා හට ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ආශ්‍රේය සාමාජිකත්වය පිරිනැමිය හැකි වේ. සෑම අවස්ථවකදීම මෙම ආශ්‍රේය නොවන සාමාජිකයන්ගේ අධීක්ෂණය මෙම සංගමයේ වරලත් හෙවත් ආශ්‍රේය සාමාජිකත්වය හිමි පුස්තකාලයාධිපතිවරයෙකු විසින් ම කළ යුතුය.

එමෙන්ම ආශ්‍රේය සාමාජිකත්වය යනු පුස්තකාල සංගමයේ වෘත්තීමය සුදුසුකම ලබා ගැනීමයි. එහිදී ආශ්‍රේය සාමාජිකයන් මෙන්ම අධි සාමාජිකත්වය ලබා ගත් සාමාජිකයන් ද වේ. ඔවුනට ඡන්දය බලය හිමි වන අතර වෘත්තීමය සාමාජිකයකු ලෙස හිමි පූර්ණ වරප්‍රසාද ද භුක්ති විඳිය හැකිය. එයට අදාළ දිනය අනුව සාමාජිකත්වය යාවත්කාලීන කර ගත් ඕනෑම ආශ්‍රේය සාමාජිකයකුට හෝ අධි සාමාජිකත්වයක් ලත් තැනැත්තෙකු හට "වරලත් පුස්තකාලයාධිපති" යන නාමය භාවිතා කිරීමට සුදුසුකම් ලබයි. ඔවුනට පිළිවෙලින් ALA (ශ්‍රී ලංකා) සහ FLA (ශ්‍රී ලංකා) යන නාමයන් භාවිතා කළ හැකිය.

වසර 03කට වැඩි කාලයක් අඛණ්ඩව මුදල් ගෙවා පවත්වාගෙන ඇති ආශ්‍රේය සාමාජිකත්වය මෙන්ම පුස්තකාල හා තොරතුරු විද්‍යා ක්ෂේත්‍රයට සැළකිය යුතු දායකත්වයක් කර ඇති අය හට අධි සාමාජිකත්වය සඳහා ඉල්ලුම් කළ හැකිය. මේ සඳහා ඇති අගැයීම් නිර්ණායකයන්හි දක්වා ඇති පරිදි තමා වෘත්තීය තුළ ලබා ගත් ජයග්‍රහණ පිළිබඳ ලේඛනගත සාක්ෂි ලබා දීමෙන් මේ සඳහා අයදුම් කළ හැකිය. එහිදී තමා විසින් පුස්තකාල හා තොරතුරු විද්‍යා ක්ෂේත්‍රයට සිදු කර ඇති දායකත්වය සළකාබැලීමේ දී අනුගමනය කරන්නා වූ නිර්ණායකයන් 04ක් වේ. ඒවා නම්

- A - පුස්තකාල හා තොරතුරු විද්‍යා ක්ෂේත්‍රය සම්බන්ධයෙන් කර ඇති මුද්‍රිත හෝ විද්‍යුත් ප්‍රකාශන
- B - ශ්‍රී ලංකා පුස්තකාල සංගමයෙහි පාලක කමිටුවෙහි ප්‍රධාන වගකීම් භාර නිලධාරියෙකු/ කමිටු සාමාජිකයෙකු ලෙස ඉටු කර ඇති සේවාව
- C - පුස්තකාල හා තොරතුරු විද්‍යා ක්ෂේත්‍රයෙහි මානව සම්පත් සංවර්ධනයට දායක වූ ආකාරය
- D - පුස්තකාල හා තොරතුරු විද්‍යාව සම්බන්ධයෙන් කර ඇති පර්යේෂණ හා නවෝත්පාදන

ආශ්‍රේය සාමාජිකත්වය විසින් සිය කැපවීම පුස්තකාල හා තොරතුරු විද්‍යා ක්ෂේත්‍රයට සිදු නොකරන කල්හි ඔහුට/ඇයට මෙම අරමුණු අභියෝගාත්මක ඒවා විය හැකිය. විශේෂයෙන් සඳහන් කළහොත් පාලක කමිටුවෙහි ඇති තනතුරු සීමිත වන බැවින් සංගමයේ ප්‍රධාන වගකීම් භාර නිලධාරියෙකු බවට පත්වීම තරමක් දුෂ්කර කාර්යයක් වේ. එබැවින් පුස්තකාල සංගමය විසින් "පර්යේෂණ මඟින් අධි සාමාජිකත්වය" හඳුන්වා දෙන ලද අතර එමඟින් සිදු කෙරෙනුයේ මෙම පාඨමාලාව හැදෑරූ සාමාජිකයෙක් හට ආශ්‍රේය සාමාජිකත්වය ලබා දීමෙන් අනතුරුව එම වෘත්තියේදී ලබා ගත හැකි ඉහළම ඉලක්කය වන අධි සාමාජිකත්වය සඳහා සුදුසුකම් ලැබීමයි. එම පාඨමාලාව හැදෑරීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සිටිය යුතු වේ. එමෙන්ම මෙම පාඨමාලාව වඩාත් වැදගත් වනුයේ කිසියම් සාමාජිකයෙකු හට ප්‍රමාණවත් ඉඩකඩක් හා කාලයක් මෙම සංගමයේ කටයුතු සඳහා යෙදවීමට නොහැකි විටදී මෙම අවස්ථාව වඩාත් ප්‍රයෝජනවත් වනු ඇත.

සමස්තයක් වශයෙන් ගත් කල, ශ්‍රී ලංකා පුස්තකාල සංගමය එහි සාමාජිකත්වය වර්ධනය කිරීම සඳහා ගත හැකි සියළුම ආකාරයේ ක්‍රියාදාමයන් හඳුන්වා දී ඇති අතර ඔවුනගේ වෘත්තියමය ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා පුස්තකාල හා තොරතුරු විද්‍යා ක්ෂේත්‍රයේ වෘත්තිකයන් වශයෙන් ඉහළට යාමට අවශ්‍ය නිර්ණායකයන් ලබා දී ඇත, මේ මොහොත වන විට ශ්‍රී ලංකා පුස්තකාල සංගමය සිය 60 වන සංවත්සරය සම්පූර්ණ කර 2021 වර්ෂය වන විට සංගමය විසින් දියත් කරනු ලබන අධ්‍යාපන පාඨමාලාව සඳහා 60 වන සංවත්සරය ද සම්පූර්ණ කරමින් සිටී. එබැවින් වෘත්තිකයන් වශයෙන් සුදුසුකම් ඇති සාමාජිකයන් ශ්‍රී ලංකා පුස්තකාල සංගමයට සම්පතක් වේ.


**ආශ්‍රිත මූලාශ්‍ර:**
https://www.slla.lk/index.php/about-slla/membership
Annual Report & Auditor's Report 2019/2020





තිරසාර පුස්තකාල සංවර්ධන වැඩසටහන යටතේ මුලතිව් හා කිලිනොච්චි දිස්ත්‍රික්වල මහජන පුස්තකාලයන්හි සේවය කරනු ලබන පුස්තකාලයාධිපතිවරුන් සහ ඒවාහි ප්‍රධාන නිලධාරීන් සඳහා පුහුණු වැඩමුළුවක් පවත්වන ලදී. මෙය ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් 2021 අප්‍රේල් 06 සහ 07 දෙදින තුළදී කිලිනොච්චි පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයීය ශ්‍රවනාගාරයේදී පවත්වන ලදී. මෙම පුහුණු වැඩසටහනේ මූලික අරමුණ වූයේ පුස්තකාල කාර්ය මණ්ඩලය පුහුණු කිරීම වන අතර එහිදී පුහුණුලාභීන්ට මූලික පුස්තකාල කළමනාකරණ සංකල්ප ඇතුළුව පුස්තකාල කළමනාකරණය පිළිබඳව පුහුණුව ලබා දෙන ලදී.

මෙම වැඩමුළුව සඳහා සම්පත්දායකයින් ලෙස ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් ඩබ්. සුනිල් මහතා ද සහකාර අධ්‍යක්ෂ ඩබ්. එම්. අරවින්ද මහතා ඇතුළු කණ්ඩායම මෙන්ම පළාත් පාලන සහකාර කොමසාරිස් එස්. ප්‍රභාහරන් මහතා ද සහභාගි විය. මේ සඳහා ඉහත දිස්ත්‍රික් දෙකෙහිම පුස්තකාලයාධිපතිවරුන් 28 දෙනෙක් සහභාගි විය. මීට සමගාමීව ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් එම ප්‍රදේශයේ මහජන පුස්තකාල සඳහා රුපියල් 15000.00 වටිනා පොත් කට්ටල පරිත්‍යාග කිරීම සහ එම පුස්තකාල ශ්‍රේණිගත කිරීම සඳහා වූ නිරීක්ෂණ චාරිකාවක් ද 2021 අප්‍රේල් 08 සහ 09 දෙදින තුළ දී සංවිධානය කර තිබුණි.




ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ 60 වැනි සංවත්සර සැමරුම නිමිත්තෙන් සහ රජයේ පුස්තකාලයාධිපතිවරුන්ගේ නිර්මාණ කුසලතා ප්‍රවර්ධනය සඳහා සකස් කරන ලද "ප්‍රතිරාව" නැමති විශේෂ විද්‍යුත් සමරු කලාපය ප්‍රකාශයට පත්විය. මෙම විද්‍යුත් සමරු කලාපය ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ නිල වෙබ් අඩවියේ ද පල කිරීමට නියමිතය.

## ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ප්‍රකාශන කමිටුව -2020/21

### ප්‍රධාන කමිටුව

| | |
|---|---|
| ටී. ශ්‍රීධරන් මිය(ප්‍රකාශන නිලධාරි) | චන්දිමා වාදසිංහ මිය |
| කෝමදී මුරුගදාස් මිය | බී.එන්.ජී.ඒ සුනිල් ප්‍රේමරත්න මහතා |
| එම්.එස්.එම්. ෂිහාම් මහතා | ඒ.වී.එම්.කේ. අංකුඹුර මිය |
| පවිත්‍රා විජයවර්ධන මිය | |

### අනු කමිටුව (පුවත් හසුන)

| | |
|---|---|
| ටී. ශ්‍රීධරන් මිය | ගයනි ලසන්තා පෙරේරා මිය |
| කෝමදී මුරුගදාස් මිය | |

### අනු කමිටුව (සඟරා)

| | |
|---|---|
| ටී. ශ්‍රීධරන් මිය | බී.එන්.ජී.ඒ සුනිල් ප්‍රේමරත්න මහතා |
| චන්දිමා වාදසිංහ මිය | එස්. නවනීතක්‍රිෂ්ණන් මයා |

ආපසු ලිපිනය :

ශ්‍රී ලංකා පුස්තකාල සංගමය,
**OPA** මධ්‍යස්ථානය,
**275/75,** ස්ටැන්ලි විජේසුන්දර මාවත,
කොළඹ **07.**

වෙත :